

# ජෝති ඔහු නිවැරදි ද..?

**2006** දෙසැම්බර් මස සන්නස පත්‍රයේ විචාරය යටතේ ලක්ෂ්මන් වැලිවිටිය මහතා ලියූ ලිපිය කියවූ මට ඒ පිළිබඳ මගේ අදහස මෙසේ ලියා එවන්නට සිත් විය.
මොනෑෂ් සරසවියේ රොටුන්ඩා ශාලාවේ මහාචාර්ය සුනිල් ආරියරත්නයන්, වික්ටර් රත්නායකයන්, රෝහණ වීරසිංහයන්, ජය ශ්‍රී චන්ද්‍රජිත් ඇතුළු විද්වතුන් රාශියකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණ සම්මන්ත්‍රණයට මමද සහභාගි වුයෙමි.
එහිදී අවධාරණය කෙරුනේ ජාත්‍යන්තර මට්ටමේ සංගීතඥයකු වන රෝහණ වීරසිංහ වැනි සංගීතඥයන් බිහිවීමට පදනම වැටුනේ කෙසේද? ඒ වෙනුවෙන් බුහුමන් ලැබිය යුත්තේ කව්රුද යන්නය.

හෙල සංගීතයේ මුල් යුගවලදී හින්දි ගීත, ඉංග්‍රීසි වැනි විදේශීය ගීතවල තණුවලට සිංහල පදමාලා යොදමින් ගීත අනුකරණය නැතහොත් කොපි කිරීම කෙරුන බවත් සුනිල් ශාන්ත, ආනන්ද සමරකෝන් ඇතුලු සිංහල සංගීතඥයන්ගේ බලවත් කැපවීම නිසා ලංකාවේ ස්වාධීන තනු නිර්මාණය ඇරඹුන බවත්, ඊට පසු බිහිවූ සංගීතඥයන් එම කටයුත්ත ඉදිරියට ගෙන ගිය බවත් එහිදී හෙළිදරව් වුණි.

ජෝතිපාල ගැන කියවුනේ ඔහු ගීත කොපි කිරීම විශාල වශයෙන් කල කෙනෙකු හැටියටය. සවතන්ත්‍ර සවර නිර්මාණ පමණක් ගායනා කිරීමේ ප්‍රතිපත්තියක් ජෝතිපාල තුල නොතිබුන නිසාත්. විශාල හින්දි ගී සංඛ්‍යාවක් අනුකරණය කිරීම නිසාත්, ජෝතිපාල සිංහල - හින්දි කොපි සංගීතයේ සංකේතය බවට පත්ව ඇත.

මෙවැනි අනුකරණ සිංහල ජාතිය ලැජ්ජාවට පත්කරන දෙයක්ය. විශේෂයෙන්ම ඉන්දියානුවන් ඉදිරියේ කොපිකරණ ලද ගීතයක් කෙසේ අසන්නෙමුද?
ගීත කොපිකිරීම අභියෝගයක් බව ගුවන් විදුලි සාකච්ඡාවකදී ජෝතිපාල පැවසුවා මතකය. ඔහු එසේ පැවසුවේ මුල් ගායනය සමග සන්සන්ධනයක් කෙරෙන බැවින් කොපිකරන ගායකයා එය වඩා හොඳින් කිරීමට උත්සාහ ගන්නා බව දැක්වීමටය.

නමුත් බොහෝ අවස්ථාවලදී ජෝතිපාල මෙම අභියෝගය ජය නොගත් බව පෙනේ.
උදාහරණයක් ලෙස මහේන්ද්‍ර කපූර් ගායනය කරන 'නිලගගන්ති තලේ'' ජෝතිපාල ගායන කරන ''සීත සුවදෙන රැයේ'' සංසන්දනය කර බලන්න. එමෙන්ම මොහොමඩ් රාෆි ගායනා කරන ''කොහි ජමු රාහැන පායේ'' ජෝතිපාල ගායනා කරන ''ආදර මධුර අතීතේ'' සමග සංසන්දනය කරන්න.
හෙල ගී සම්ප්‍රදායක් බිහි කිරීමට උදව් කල තවත් පුද්ගලයෙක් නම් අභාවප්‍රාප්ත රිජ්වේ තිලකරත්නයන්ය. කොපි ගීත ගුවන්විදුලියේ ප්‍රචාරය නොකිරීමේ දැඩි ප්‍රතිපත්තියක් ඔහු ගුවන් විදුලි අධයක්‍ෂක ජනරාල් වශයෙන් වැඩ කළවිට අනුගමනය කිරීම නිසා ගීත කොපි කිරීමට ඇබ්බැහි වූ සංගීත අධ්‍යක්‍ෂකවරුන්ද ස්වාධීන තනු නිර්මාණ කරන්නට පෙළඹුන බව රෝහණ වීරසිංහයන්ගේ සංගීත දිවියට වසර 30 පිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකාවේ පැවැත්වුන වැඩමුළුවකදී මහාචාර්ය සුනිල් ආරියරත්න පැවසීය.

රොටුන්ඩා ශාලාවේ මෑත තිබූ සම්මන්ත්‍රණයේදී වික්ටර් පැවසුවේ මුලදී අනුකරණය කළ අය ලැජ්ජාවට පත්ව ''අනේ මටත් තනුවක් හදා දෙන්න'' යනුවෙන් ඉල්ලීමක් කරන තත්ත්වයට ඒ අය පත්වුන බවය. කෙසේ වුවද ජෝතිපාල හොඳ කටහඬක් ඇති ගායකයකු බව මහාචාර්ය සුනිල් ආරියරත්න පවසා ඇති බව අප අමතක කලයුතු නැත.

අපක්‍ෂපාතීව බැලුවහොත් ස්වාධීන තනු නිර්මාණ රාශියකටද ඔහු ගයා ඇති බැවින් ගීත සාහිත්‍යයට ඔහු දායක නොවූ බව පැවසීම සාවද්‍යය. නමුත් ඔහු කල වරද නම් කොපි නොකිරීමේ ප්‍රතිපත්තියක් නොරැකීමය. ජෝතිපාල කෙරෙහි භක්තියක් ඇති රසිකයින් කල යුත්තේ හෙල සංගීත ක්‍ෂේත්‍රයේ ඇති වල් පැලෑටි නොව ඔහු විසින් රෝපනය කිරීමට උදව් කරන ලද හොඳ බෝග තෝරා ඒවා අගය කිරීමය. ඔහුට කල හැකි ලොකුම ගෞරවය එයයි.

### ජෝතිපාලගේ සවතන්ත්‍ර ගී කිහිපයක්

| ගීතය | සංගීතඥයා / තනු නිර්මාපකයා | චිත්‍රපටය |
|---|---|---|
| 1. කන්දෙන් ලන්දෙන් ලන්දට | පණ්ඩිත ඩබ්.ඩී. අමරදේව | තරංගා |
| 2. රිදී වල තුලින් එබී (ශ්‍රීමති තිලකරත්න සමග) | පි.වී. නන්දසිරි | දැවෙන පිපාස |
| 3. මන්මත් කරවන වීනා රාවේ | ආචාර්ය ලයනල් අල්ගම | ප්‍රදීපේ මා වේවා |
| 4. ආසා දහසක් | ෂෙල්ටන් ප්‍රේමරත්න | හිතක පිපුන මල් |
| 5. පාට පොටක් තිලකලා | සරත් දසනායක | |
| 6. ආදර මල් පවනේ | ප්‍රේමසිරි කේමදාස | දුලීකා |
| 7. හිනාවෙන්නේ ඇයි මේ | එම්.කේ. රොක්සාමි | සංසාරේ |
| 8. මුලදි බැන්ද ආදරයක මිහිර දැන් | මොහොමඩ් සාලි | - |
| 9. පුරුතු ගීසිකාරයා | සුනිල් ශාන්ත / ආර්. මුත්තුසාමි | සංදේශය |
| 10. සොඳුරු ලොවට මල් වැහැලා | ක්ලැරන්ස් විජේවර්ධන | අපේක්ෂා |
| 11. රාජ ඉසුරු පලන්දාපු | රජ්ජුරුවෝ වික්ටර් රත්නායක | අනුපමා |

## නිදහස් දින අසිරිය කිග්ස්ටන් නගර ශාලාවේ දී



Photo Oscar Perera





TRY ME

ට්‍රයි මී යෝගට්
මී කිරි වගේමයි
එක වරක් රසවිඳ බලන්න

රස පිරි TRY ME




යෝගට්
මුරුක්කු
පාටි මික්ස්
ස්වීට්ස්

V & S Imports & Exports
03 9465 3852

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243

RECON BUMPERS
All Types of Bumper Bar Recondition And Spray Painting

දැන් ඕනෑම වර්ගයක
වාහන බම්පර් බාර් අලුත්වැඩියා කිරීම
හා ස්ප්‍රේ පේන්ට් කරගැනීම
සඳහා ඔබ යා යුතු එකම ස්ථානය

විමසීම්
රාමනායක 0404 059 027



RECON BUMPERS
61/4 Lonsdale St
Dandenong

- ශ්‍රී ලාංකික සුහද සේවය -